# 19

# ග්‍රන්ථ සංස්කරණය
## Textual Criticism

*මහාචාර්ය උදය ප්‍රශාන්ත මැද්දේගම*

ග්‍රන්ථ සංස්කරණය ශාස්ත්‍රයක් හෝ විද්‍යාවක් වශයෙන් මෙකල උගතුන් අතර එතරම් සාකච්ඡාවට ලක් නොවන විෂයයක් හෙයින් ඒ පිළිබඳව මේ කෙටි ලිපිය ලියන්නට අදහස් කළෙමි. එහෙත් මෙය ලංකාවේ පමණක් නොව ලොව බොහෝ රටවල විශේෂයෙන්ම පැරණි සාහිත්‍යයන්ට හිමිකම් කියන රටවල උගතුන්ගේ අවධානය කලක සිට දිනා ගෙන ඇති විෂයයකි. 19 වන සියවසේ හා 20 වැනි සියවසේ මුල් භාගයේ දී ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව වැනි රටවල ශාස්ත්‍රීය කටයුතුවල නියැළුණු ප්‍රාචීන විශාරදයෝ ග්‍රන්ථ සංස්කරණ විෂයයෙහි දියුණුවට ඉමහත් සේවයක් ඉටු කළහ. ග්‍රන්ථ සංස්කරණය අවශ්‍ය වන්නේ මන්දැයි මහාචාර්ය කුලසූරිය පන්සිය පනස් ජාතක පොතේ ශාස්ත්‍රීය සංස්කරණයට සැපයූ පෙරවදනේ මෙසේ සඳහන් කරයි.

> "සංස්කාරකයෙකුගේ ප්‍රධාන කාර්යය මුල් පොත සැකැසීම යි. ඒ මුල් පොත වනාහී අනේකවිධ ඓතිහාසික කරුණු ද අන්‍ය වූ බාහ්‍ය සාධක ද හේතු කොට ගෙන ඉතා වැඩි අවස්ථාවල දී නොකළ හැක්කක් බවට පත් වී ඇති මුත් එ වැන්නක් සැපැයීමයි. නො එසේ නම් ඒ මුල් පොතට ඉතා ළංවන පෙළක් පිළියෙළ කිරීමයි. ක්‍රම තුලනය වැඩට ගැන්මෙන් මේ අරමුණ ඉටු කිරීම අපේක්ෂිතයි. මුල් පොතේ ලද හැකි නන් වැදෑරුම් පිටපත් රැස්කොට පිරික්සා අත් පොත් පරපුර එක් රැස් කිරීම මූලික ගැටලුව වෙයි. එසේ කිරීමෙන් නානා විධ වූ ද පරස්පර විරෝධී වූ ද පාඨාන්තර අතුරින් කිනම් රූපය වඩා ම සුදුසු වන්නේ දැයි තීරණය කළ හැකි වේ."

එසේ ම යුරෝපයේ සියවස් දෙකකටත් වැඩි කලක සිට ග්‍රීක හා රෝම සම්භාව්‍ය සාහිත්‍ය කෘති කෙරෙහි සැලකිල්ල වැඩිවත්ම ඒවා යළි මුද්‍රණයෙන් පළ කිරීම සඳහා ඒවායේ පිටපත් එකතු කරමින්, සසඳමින් ඒවායේ නිවැරදි පිටපත් සකස් කර ගැනීම සඳහා එම රටවල වියත්තු මහත් පරිශ්‍රමයක් දරමින් මෙම විෂයයේ ඉමහත් දියුණුවක් ඇති කළහ. ග්‍රන්ථ සංස්කරණය හුදෙක් සාහිත්‍යයේ හා භාෂාවේ දියුණුව කෙරෙහි පමණක් නොව අතීත සංස්කෘතිය, ඉතිහාසය වැනි වෙනත් විෂයයන් පිළිබඳව නව සොයා ගැනීම්වලට ද ඉවහල් වන්නකි. අති විශාල පුරාතන සාහිත්‍යයකට විශේෂයෙන් ම භාෂා කීපයකින් ලියැවුණු විෂය



රාශියකට අයත් ග්‍රන්ථවලට උරුමයක් ඇති ඉන්දියාව වැනි රටක ග්‍රන්ථ සංස්කරණය හුදු විෂයයක් වශයෙන් පමණක් නොව විද්‍යාවක් වශයෙන් ද දියුණු කිරීම අවශ්‍ය විය. සම්භාව්‍ය සාහිත්‍ය කෘති සංස්කරණය කෙරෙහි අවධානය යොමු කළ වියත්තු විවිධ මූල ධර්ම හා ක්‍රම අත්හදා බලමින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත්හ. ආනන්ද කුලසූරිය එබඳු ක්‍රම අතරින් හතරක් ඉදිරිපත් කරයි.

**හ්‍යුරිස්තික්ස්** එනම්, අත් පිටපත් සාක්ෂ්‍ය ඇතුළු සකලවිධ මූලාශ්‍රය පෙළපතේ සටහනක අයුරින් රැස් කිරීම, පිළියෙල කිරීම.
**රෙකෙන්සියෝ** මුල් සැලැස්මේ පෙළ යළි සැකැසීම.
**එමෙන්දාතියෝ** එනම් කතුවරයාගේ මුල් පෙළ යළි සැකැසීම.
**ඉහළ විචාරය** එනම් කර්තෘ මූලාශ්‍රය විශ්ලේෂණය

කුලසූරිය සංස්කරණයක දී පිළිපැදිය යුතු මෙම "ශාස්ත්‍රීය පිළිවෙත්" උපුටාගෙන ඇත්තේ මහාභාරතය පුන සංස්කරණය කළ වී.එස්. සුක්තන්කර් ගෙන් බව පන්සිය පනස් ජාතක පොත ශාස්ත්‍රීය සංස්කරණයේ පෙර වදනෙහි (131 පිටුව) සඳහන් කරයි. මේ ක්‍රම අතර මුලින් දැක්වෙන හ්‍යුරිස්තික්ස් මේ ලිපියේ විස්තර කෙරෙන පරම්පරා / පවුල් ගස ක්‍රමය හා සමාන වන බව සිතිය හැකියි.

ග්‍රන්ථ සංස්කරණය සාහිත්‍ය විචාරයේ ම අංගයක් ලෙස ද සලකනු ලැබේ. මෙයින් මූලික වශයෙන් කෙරෙනුයේ කිසියම් ග්‍රන්ථයක් අතින් පිටපත් කිරීමේ දී සිදු වූ වැරදි හඳුනා ගෙන ඒවා ඉවත් කර නිවැරදි, නැත්නම් පිරිසිදු පිටපතක් සකස් කර ගැනීමයි. පැරණි ලියන්නෝ / පිටපත් කරන්නෝ පොත් අතින් පිටපත් කිරීමේ දී නොයෙකුත් වැරදි සිදු කළහ. (ඇතැම් සිංහල පුස්කොළ පොත්වල 'මෙතන සිට වැරදි, මෙතන සිට හරි' වැනි සටහන් පිටපත් කරන්නන් යෙදූ අවස්ථා අප දැක ඇත.) සංස්කාරකයා කරන්නේ කිසියම් කෘතියක පිටපතක් හෝ පිටපත් කීපයක් සොයා ගෙන ඒවා සසඳා බලමින් තමාට හැඟෙන පරිදි අපපාඨ ඉවත් කර මුල් කෘතියට ඉතාමත් සමීප කෘතියක් සකස් කිරීමයි. ග්‍රන්ථ සංස්කරණය පිළිබඳ විශාරදයෝ එම පිටපත පූර්වාදර්ශය (archetype) නමින් හඳුන්වති. මේ ක්‍රමය අනුව කිසියම් ග්‍රන්ථයක් පිටපත් කිරීමේ ඉතිහාසය තුළ අතර මැදි කාලයට අයත් විචාරාත්මක සංස්කරණ හෙවත් recensions හඳුනා ගැනීම ද කළ හැකිය. විචාරාත්මක ග්‍රන්ථ සංස්කාරකයාගේ අවසන් අරමුණ වන්නේ මුල් කෘතියට ඉතාමත් ම සමීප වන 'critical edition' හෙවත් විචාරාත්මක සංස්කරණයක් නිමැවීමයි. ග්‍රන්ථ විචාර සංස්කරණ ශාස්ත්‍රයට සම්බන්ධ මූලික ප්‍රවේශ කීපයක් වෙයි. දැනට බටහිර රටවල වඩාත් ප්‍රචලිත මෙසේ ය.

i. Eclecticim තෝරා ගැනීම
ii. Stemmatics පවුල් ගස
iii. Copy-Text edition පදනම් පිටපත් ක්‍රමය

ජීව විද්‍යා ශිල්පීය ක්‍රමයක් වන cladistics ද අත් පිටපත් අතර සම්බන්ධතා නිශ්චය කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ. ග්‍රන්ථ සංස්කරණය හා ඉහළ විචාරය අතර වෙනස දැක්වීම සඳහා පහළ විචාරය යන යෙදුම භාවිත කෙරේ.

ජාත්‍යන්තර වශයෙන් බලන කල ග්‍රන්ථ සංස්කරණ ශාස්ත්‍රයට/විද්‍යාවට වසර 2000 ටත් වැඩි වූ ඉතිහාසයක් ඇති බව කියනු ලැබේ. මුල් කාලයේ සංස්කාරකයින්ගේ ප්‍රධාන අරමුණ වූයේ පූරාණ ග්‍රන්ථ ආරක්ෂා කර ගැනීමයි. මෙය මධ්‍යතන යුගයේ මුල් අවදිය තෙක් එනම් මුද්‍රණ යන්ත්‍රය නිපදවන තුරුම පැවතිණි. බයිබලය හා පූරාණ ග්‍රීක නාට්‍ය වැනි බොහෝ පැරණි ග්‍රන්ථවල පිටපත් සිය ගණනක් ඉතිරි වී ඇතත් ඒවා මුල්ම පිටපත්වලට කොතෙක් දුරට සමාන ද යනු දැන ගත නොහැකිය. කුමන මූලාශ්‍රයක් මුල් කෘතියෙන් පිටපත් කර ගන්නා ලද්දේ ද එබැවින් ඒවා අතරින් කුමන පිටපත් වඩා විශ්වසනීය ද යනු සියවස් ගණනාවක් තිස්සේ විවාදයට ලක් වී ඇත. බයිබලය හා ග්‍රීක නාට්‍යවලට ද මුල දී එකම මුල් කෘතියක් තිබෙන්නට ඇත. ශුභාරංචි වැනි සමහර බයිබල් කෘතිවලට තිබුණේ එකම මුල් කෘතිය ද යනු විමසීමට ලක් වී ඇති කරුණකි. සිංහල සාහිත්‍යයේ ද ඇතැම් ග්‍රන්ථ පිළිබඳව මෙබඳු තත්වයක් තිබිය හැකියි. පන්සිය පනස් ජාතක පොත සිංහලට නගන ලද්දේ පරිවර්තක මණ්ඩලයක් විසිනි. එම කාර්යය නිමවීමට දිගු කලක් ගතවන්නට ඇත. රාජ්‍ය අනුග්‍රහය යටතේ නිම වූ විගස වැදගත් ස්ථානවලට බෙදා දීම සඳහා පිටපත් කීපයක්ම එකවර ලියන්නට ඇතැයි සිතිය හැකියි. මහනුවර යුගයේ දී පවා ඇතැම් කෘති රාජ්‍ය අනුග්‍රහයෙන් සියලු පන්සල්වලට පිටපත බැගින් දීම සඳහා පිටපත් කර වූ බව අසන්නට ලැබේ. එවිට එබඳු කෘතියක නිවැරදි මුල් පිටපත කුමක්දැයි සොයා ගැනීම කළ නොහැක්කකි. කතුවරයාම සියතින් ලියූ මුල් පිටපත සොයා ගත හැකි නම් මේ ගැටලුව මතු නොවේ. එහෙත් එය කිසිසේත් ම කළ නොහැක්කක් බවට පත් වී ඇත්තේ සිංහල ග්‍රන්ථ පුරාණයේ ලිවීමට භාවිත කෙරුණු තල කොළ එතරම් කලක් නොපවතින හෙයිනි. දිරාපත් වීම හෝ කෘමි සතුන්ගේ උවදුරු නිසා පුස්කොළ පොත් වැඩි කලක් නොපවතී. එබැවින් ඒවා පවත්වා ගැනීම සඳහා වරින්වර පිටපත් කරන්නට සිදුවෙයි. එසේ නිරන්තරයෙන් පිටපත් කිරීමේ දී නොයෙකුත් වැරදි හා වෙනස්කම් සිදුවීම ද වැළැක්විය නො හැකිය.

වෙනත් භාෂා සාහිත්‍යයන් සම්බන්ධව ද මෙබඳු ගැටලු මතු වී ඇත. 1972 දී සනා අත් පිටපත් නමින් හැඳින්වෙන පිටපත් සොයා ගැනීමත් සමඟ ඉස්ලාම් කුරාණය සඳහා ද ග්‍රන්ථ සංස්කරණ ක්‍රම යොදා ගත යුතු ද යන ප්‍රශ්නය මතු වී ඇත. සනා අත්පිටපත් 7-8 සියවස් අතර කාලයේ ලියන ලද ඒවා විය හැකි බව සිතනු ලැබේ. විලියම් ෂේක්ස්පියර්ගේ නාට්‍ය ඉංග්‍රීසි ග්‍රන්ථ සංස්කාරකයින්ගේ ඉමහත්



උද්‍යෝගයට හා අවධානයට යොමු වූ කෘති සේ ප්‍රකටය. එම ග්‍රන්ථ සංස්කරණයේ දී ඔවුන්ට ගැටලු රාශියකට මුහුණ දෙන්නට සිදු වූ අතර ෂේක්ස්පියර්ගේ ඉතාමත් ප්‍රසිද්ධ නාට්‍යවල පවා ඇතැම් වචන හා පාඨ පිළිබඳව නිරාකරණය නොවූ මතභේද රාශියක් පවතී. එම නාට්‍ය පරපුරෙන් පරපුරට පැවත එද්දී ඒවායේ නොයෙකුත් වෙනස්කම් සිදුවීම ද නොවැළැක්විය හැකි බව ද කතුවරයාගේ ප්‍රසිද්ධිය හා වැදගත්කම එන්න එන්නම වැඩි වීම නිසා ඔහුගේ කෘතීන් වඩාත් ශ්‍රමය යොදවා වියදම් දරමින් සංස්කරණය කොට පළ කිරීම ඉතාමත් ප්‍රතිඵලදායක බව ද පෙනී ගොස් ඇත. මෑත කාලයේ විචාරාත්මක ග්‍රන්ථ සංස්කරණය බයිබලය වැනි වැදගත් ආගමික ග්‍රන්ථ හා ෂේක්ස්පියර් වැනි පැරණි කලාකරුවන්ගේ කෘති සංස්කරණය අරමුණු කර ගෙන දියුණු කරනු ලැබුවත් දැන් දැන් ඉතා පුරාණ කාලයට අයත් මෙසපොතේමියානු හා ඊජිප්තු ලේඛන සඳහා ද එය යොදා ගනු දක්නට ලැබේ.

ග්‍රන්ථ සංස්කරණය පිළිබඳ මූලික ගැටලුවක් පෝල් මාස් මෙසේ ඉදිරිපත් කරයි. "ග්‍රීක හා රෝම සම්භාව්‍ය ලේඛකයින්ගේ නම් සහිත අත් පිටපත් හෝ මුල් කෘති හා සසඳා බලා සැකසූ පිටපත් අපට ලැබී නැත. අපට ලැබී ඇත්තේ මුල් කෘතියට පසුව කරන ලද අන්තර්කාලීන පිටපත් පමණි. ඒ නිසා ඒවායේ විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රශ්න මතු වේ. විචාරාත්මක ග්‍රන්ථ සංස්කරණයේ අරමුණ නම් මුල් කෘතියට හැකිතාක් සමීප කෘතියක් නිර්මාණය කර ගැනීමයි." මෙහිදී මාස් තවදුරටත් කියා සිටින්නේ කතුවරයා විසින් කියවන විට වෙනත් කෙනෙකු විසින් පිටපත් ගන්නා ලද කෘති ද සැබෑ අත්පිටපත් ලෙස භාර ගත හැකි බවයි. කතුවරයාගේ නම රහිත අත්පිටපත් පිළිබඳ ප්‍රශ්නය ග්‍රීක හා රෝම සාහිත්‍යයන්ට පමණක් සීමා වූවක් නොවේ. පූරාතන සංස්කෘත හා සිංහල සාහිත්‍යයන්හි ද එබඳු කෘති කොතෙකුත් තිබේ. අමාවතුර, බුත්සරණ හා දහම් සරණ වැනි කෘතිවල කතුවරුන් ගැන අප දන්නේ අනුමානයෙන් හා ජනප්‍රවාද අනුව පමණි. අප අද භාවිත කරන මුද්‍රිත පිටපත් පූර්ව සංස්කරණ රාශියක් තුළින් විවිධ වෙනස්කම්වලට බඳුන් වූ ඒවාය. පන්සිය පණස් ජාතක පොත සංස්කරණයේ දී පවතින මුද්‍රිත ජාතක පොත්වල සාවද්‍ය වචන හා යෙදුම් මහත් රාශියක් තිබෙන අයුරු අපට දක්නට ලැබිණි. එබඳු තත්ත්වයක් තුළ වඩාත්ම නිවැරදි යෙදුම හෝ වචනය සොයා ගන්නා ලද පිටපත් රාශියක් හා සසඳා බලා තීරණය කළ යුතු විය. තමන් භාවිත කරන්නේ පුස්කොල පිටපත් නම් ඒවා අතරින් වඩාත්ම පැරණි පිටපත කුමක් දැයි සොයාගත හැකිනම් එය සංස්කාරකයාට අතිශයින් ප්‍රයෝජනවත් වනු ඇත. පිටපත් අතරින් පැරණිම ආදර්ශය/පිටපත archetype හෙවත් පූර්වාදර්ශය ලෙස හඳුන්වනු ලැබේ. පූර්වාදර්ශයේ පෙළ නිසි ලෙස තහවුරු කරගත හැකි නම් මුල් කෘතිය ප්‍රතිනිර්මාණය කර ගැනීම සැලකිය යුතු තරම් ඉහළ මට්මටමකට ළඟා වනු ඇත. ග්‍රන්ථ සංස්කාරකයාගේ අවසන්

ඉලක්කය 'critical edition' හෙවත් විචාරාත්මක සංස්කරණයක් නිෂ්පාදනය කර ගැනීමයි. එමගින් මුල් කෘතියට ඉතාමත් සමීප පිටපතක් ද ඊට අදාළ විචාරාත්මක මෙවලම් ද ඊට ඇතුළත් වනු ඇත.

* සංස්කාරකවරයා සලකා බැලූ සාක්ෂ්‍ය (අත් පිටපත්වල නම් හෝ ඒවා වෙනුවෙන් යොදා ගත් සංකේත)
* එම සාක්ෂ්‍ය පිළිබඳව සංස්කාරකගේ විග්‍රහයන් (සමහර විට සමානතා පිළිබඳ සරල ඇගයීම් වැනි)
* ප්‍රතික්ෂේප කරනු ලැබූ විකල්ප පිළිබඳ වාර්තාවක් (සාමාන්‍යයෙන් කැමැත්තේ අනුපිළිවෙලට)

මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීමට පූර්ව කාලයේ පොත්පත් අතින් පිටපත් කරනු ලැබූ හෙයින් ලියන්නන් හෝ පිටපත් කරන්නන් අතින් අලුතින් බොහෝ විකල්ප යෙදුම් එක්වන්නට ඉඩ තිබිණි. මුද්‍රණ ශිල්පයේ හා එම කර්මාන්තයේ දියුණුවත් සමග පිටපත් කරන්නන්ගේ (ලංකාවේ නම් ලියනරාල වැනි) වෘත්තිය නිෂ්ප්‍රයෝජන නැත්නම් අතිරික්ත එකක් බවට පත්විය. මුද්‍රිත පිටපත්වලට අතින් ලියූ පිටපත්වලට තරම් වෙනස් වචන හෝ විකල්ප යෙදුම් වැනි දේ ඇතුළත් වීමට ඇති ඉඩකඩ අඩු වුවද ඇතැම් මුද්‍රිත පිටපත් එක්තරා ප්‍රමාණයකට හෝ කතුවරයාගේ මුල් පිටපතට වඩා වෙනස් වීමට ඉඩක් නැත්තේම නොවේ. (නූතන ප්‍රකාශන සමාගම් විසින් ඔවුන්ට විශ්වාස පිටපත් සංස්කාරකයින් copy-editors) යොදවා ගනු ලැබේ. ඔවුන් අතින් කතුවරයාගේ පිටපත වෙනස් කරනු ලැබීමට (බොහෝ විට කතුවරයාගේ අනුමැතිය ඇතිව) ඉඩ තිබේ. මෙසේ පැරණි කාලයේ පිටපත් කරන්නන්ගේ වැරදි මෙන්, නූතන කාලයේ අකුරු අමුනන්නන් (වර්ණ යෝජකයින්) නැත්නම් මෙකල අකුරු ලියන්නන් හෝ පරිගණක ගත කරන්නන් අතින් කතුවරයාගේ පිටපතේ වෙනස්කම් සිදුවීමට කොතෙකුත් ඉඩ තිබේ. ඒ ඒ පිටපත් කරන්නා හෝ මුද්‍රණ ශිල්පියා එකිනෙකාට වෙනස් වැරදි සිදු කරන හෙයින් නැතිව ගිය මුල් පිටපත ප්‍රතිනිර්මාණය කිරීම සඳහා මූලාශ්‍රය රාශියකින් පාඨ තෝරාගැනීමට සිදුවෙයි. මූලාශ්‍රය රාශියක් සසඳමින් කරනු ලබන සංස්කරණය හෙවත් තෝරා ගැනීමේ සංස්කරණ ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. මේ ක්‍රමයට වෙනස් අන්දමින් සමහර සංස්කාරකයෝ ලබා ගත හැකි පිටපත් අතරින් හොඳම පිටපත තෝරා ගනිමින් පිටපත් රාශියක ඇති විකල්ප පාඨ සැසඳීම හෝ ඒවා අතරින් හොඳම පාඨය තෝරා ගන්නට කැමති නොවෙති.

එක් මුල් කෘතියක විවිධ ලේඛන පිටපත් නැත්නම් සාක්ෂ්‍ය සැසඳීමේ දී දක්නට ලැබෙන වෙනස්කම් විකල්ප පාඨ නැත්නම් පාඨාන්තර හෝ කියැවීම් ලෙස හඳුන්වනු ලැබේ. එම විකල්ප අතරින් කතුවරයාගේ මුල් යෙදුම හෝ වචනය කුමක්දැයි තීරණය කිරීම පහසු නොවේ. (බලන්න-



අමාවතුර ඤාණාලෝක සංස්කරණය) ඒ එක් එක් විකල්ප වචනය අත් වැරදීමකින් නැවත නැවත යෙදීම නිසා නැතිනම් අත්හැර දැමීම නිසා හෝ හිතාමතා ම (සමාන කිරීම හෝ කප්පාදු කිරීම වැනි) සිදු වූවක්දැයි විස්තර කිරීමට සංස්කාරක උත්සාහ දරයි. මුල් ග්‍රන්ථය පිටපත් කිරීමේ දී ලියන්නන් හෝ සූපරීක්ෂකවරුන් එම වෙනස් කිරීම් හෝ ඉවත් කිරීම් අලුතින් එක් කිරීම් වැනි දේ පවත්වා ගෙන ආ ආකාරය මේ සඳහා සැලකිල්ලට ගනු ලැබේ. මේ අනුව ග්‍රන්ථ විචාරක සංස්කාරකවරයාගේ ප්‍රධාන කාර්යය වන්නේ මුල් කෘතියට අයත් නොවේයයි ඉතාමත් පැහැදිලිව පෙනෙන රූපාන්තර ඉවත් කරමින් සියලු විකල්ප යෙදුම් (පාඨාන්තර) අතරින් වඩාත්ම සුදුසු යෙදුම තෝරා ගනිමින් "විචාරාත්මක" පිටපතක් හෝ "විචාරාත්මක සංස්කරණයක්" ස්ථාපනය කර ගැනීමයි. එවිට එය මුල් පිටපතට නැත්නම් කතුවරයාගේ මුල් පිටපතට ඉතාමත්ම සමීප-සමාන පිටපත ලෙස සලකනු ලැබේ. එවිට පවතින සාක්ෂ්‍ය/විකල්ප යෙදුම් තමන් ප්‍රතිනිර්මාණය කළ මුල් පිටපත හා සම්බන්ධ වන්නේ කෙසේ ද යනු විචාරාත්මක සංස්කරණය කියවන පාඨකයාට පැහැදිලිව දැක ගත හැකි වනු ඇත. විචාරාත්මක සංස්කරණය නිමවා ගැනීමේ දී (ස්ථාපනය කර ගැනීමේදී) සංස්කාරකවරයා "බාහිර" සාක්ෂ්‍ය, කාලය, නැත්නම් කොතරම් පැරණි ද යන්න, ඒ ඒ සාක්ෂ්‍ය අතර සම්බන්ධය වැනි) "අභ්‍යන්තර" නැත්නම් " භෞතික" කරුණු (කතුවරයා සහ පිටපත් කරන්නන්, නැත්නම් වර්ණයෝජකයින්, කරන්නට ඇතැයි සිතිය හැකි දේ) යන දෙඅංශයම සලකා බැලිය යුතු වේ.

කිසියම් කෘතියක සොයා ගත හැකි විකල්ප යෙදුම් සියල්ල සොයා ගැනීම, නැතිනම් එක්තැන් කිරීම යුරෝපීය සංස්කාරකවරුන් හඳුන්වන්නේ variorum (විවිධ පිටපත් හා සංස්කරණවල එන විකල්ප හා වෙනස් යෙදුම් සහිත සංස්කරණ) ලෙසිනි. ඉන් අදහස් වන්නේ කිසියම් ග්‍රන්ථයක් මුද්‍රණය සඳහා සකස් කිරීමේ දී සංස්කරණය සම්බන්ධ තීරණ ගන්නා ලද්දේ කෙසේදැයි පාඨකයාට දැනගත හැකි ලෙස, සියලු විකල්ප හා emendations සංශෝධනයන් / නිවැරදි කිරීම් එක ළඟ දක්වා ඇති, විචාරාත්මක ලෙස සංස්කරණය කරන ලද කෘතියක් බවයි. ඉංග්‍රීසි බයිබලය හා විලියම් ෂේක්ස්පියර්ගේ කෘති මෙම වේරියොරම් එඩිෂන් හෙවත් සියලු විකල්ප පාඨ හා වෙනස් යෙදුම් සහිත සංස්කරණයන් සඳහා නිදසුන් වශයෙන් දක්වනු ලැබේ. වොල්ට් විට්මන් හා එඩ්වර්ඩ් ෆිට්ස්ජෙරල්ඩ් වැනි ලේඛකයින්ගේ කෘති සඳහා ද එක්තරා දුරකට වේරියරම් සංස්කරණ ක්‍රමය යොදා ගනු ලැබ ඇත. සිංහල සාහිත්‍යයේ මේ ක්‍රමයට තරමක් සමීප සංස්කරණවලට නිදසුන් ලෙස කෝදාගොඩ ඤාණාලෝක හිමිගේ අමාවතුර සංස්කරණය (1967), ලබුගම ලංකානන්ද හිමිගේ බුත්සරණ සංස්කරණය (1968) ඩී.ඊ. හෙට්ටිආරච්චිගේ ධම්පියා අටුවා ගැටපද සංස්කරණය (1974),

ඩී.පී. ආර්. සමරනායකගේ නිකාය සංග්‍රහ සංස්කරණය (1966) හා ඇම්.බී. ආරියපාලගේ කව්සිළුමිණි සංස්කරණය (1965) නිදසුන් වශයෙන් ඉදිරිපත් කළ හැකියි.

## තෝරාගැනීම (Eclecticism)

කිසියම් එක් මූල ග්‍රන්ථයක් සඳහා සොයා ගත හැකි විශාල විවිධත්වයකින් යුත් සාක්‍ෂ්‍ය පරීක්‍ෂා කර බැලීම එක්ලෙක්ටික් හෙවත් තෝරාගැනීමේ ක්‍රමය මගින් සිදුවේ. ස්වාධීන පිටපත් වැඩි වන තරමට, ඒවා තුළ එක ම වරද සිදුවීමට ඇති ඉඩ කඩ අඩු වන බව මෙයින් අදහස් කෙරේ. එක් කෙනෙක් අත් හරින දේ තවත් කෙනෙකු රඳවා ගැනීමට ඉඩ තිබේ. එසේ ම කෙනෙකු එකතු කරන දේ වෙනත් අය ද එකතු කිරීමට ඉඩ නැත. සාක්‍ෂ්‍ය අතර තිබෙන වෙනස්කම් පාදක කර ගනිමින් මුල් කෘතිය පිළිබඳ අනුමානයන් ඇති කර ගැනීමට එක්ලෙක්ටික් ක්‍රමය මගින් හැකියාවක් ලැබේ. ලබා ගත හැකි සෑම පාඨාන්තරයක් සඳහා ම සාක්‍ෂ්‍ය කොපමණ තිබේදැයි හැඟීමක් ඇති කරගන්නට මේ ක්‍රමය මගින් අවස්ථාව සැලසේ. සාක්‍ෂ්‍ය වැඩි ගණනකින් අනුමත කෙරෙන රූපය සාමාන්‍යයෙන් අනුමත කරනු ලැබුවත් මෙය ඉබේ ම මෙන් සිදුවන්නක් නොවේ. නිදසුනක් වශයෙන් ෂේක්ස්පියර් නාට්‍යයක දෙවැනි සංස්කරණයේ, සංස්කරණ දෙක අතරතුර කාලයේ වූ සිදුවීමක් ගැන සඳහන් වන්නට පුළුවන. ඉන්පසු කෙරුණු හැම සංස්කරණයක ම ඒ සඳහන ඇතුළත් විය හැකි නමුත් විචාරාත්මක ග්‍රන්ථ සංස්කාරකවරයා එම පශ්චාත් කාලීන සඳහන අත්හැර දමා මුල් පිටපත ප්‍රතිනිර්මාණය කරයි. මෙයින් ලැබෙන ප්‍රතිඵලය සාක්‍ෂ්‍ය රාශියකින් ලබා ගත් රූපාන්තර ඇතුළත් සංස්කරණයකි. එය කිසියම් විශේෂ අත්පිටපතකින් ලබා ගත් එක් පිටපතක් නොවේ. එසේ ම එය අදාළ කෘතියට අයත් සෙසු සියලු පිටපත්වලින් වෙනස් වූවක් විය හැකියි. ඉතාමත් ම පිරිසිදු තෝරා ගැනීමේ සංස්කරණ ක්‍රමය තුළ කිසිදු එකම සාක්‍ෂ්‍යයක් සෛද්ධාන්තික වශයෙන් විශේෂ සැලකිල්ලක් නොලබයි. ඒ වෙනුවට සංස්කාරකවරයා/විචාරකයා එක් එක් සාක්‍ෂ්‍යය ගැන තමාගේ මතයක් ඇතිකර ගනී. ඒ සඳහා ඔහු බාහිර හා අභ්‍යන්තර යන දෙ අංශයේම සාක්‍ෂ්‍ය සැලකිල්ලට ගනී. 19 වැනි සියවසේ මැද භාගයේ සිට කිසිදු එක ම අත්පිටපතක් කෙරෙහි කල් තබා ඇතිකර ගත් පක්‍ෂපාතිත්වයක් නැති තෝරා ගැනීමේ ක්‍රමය ප්‍රමුඛතම සංස්කරණ ක්‍රමය බවට පත් වී ඇත. යුරෝපීය උගතුන් සාමාන්‍ය වශයෙන් අලුත් ගිවිසුමේ ග්‍රීක සංස්කරණය වැනි සංස්කරණ සඳහා මේ ක්‍රමය යොදා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ද ප්‍රධාන පෙළේ ග්‍රන්ථ සංස්කාරවරුන් වූ ඩී.බී. ජයතිලක, ඩී.ඊ. හෙට්ටිආරච්චි, ඤාණාලෝක හිමි, කුලසූරිය හා ආරියපාල වැනි අය අනුගමනය කර ඇත්තේ මේ ක්‍රමයයි.



## පරම්පරා/ (පවුල් ගස) ක්‍රමය (Stemmatics)

මෙය ග්‍රන්ථ සංස්කරණ විධීන් අතර ඉතාමත්ම දෘඪ විධිය ලෙස සැලකේ. මේ ක්‍රමය දියුණු කර ලීමට ඉමහත් සේවයක් කළ වියතා ලෙස සලකනු ලබන්නේ Karl Lachmann (1793-1851) ය. එහෙත් මෙය ලහ්මාන් විසින් ම සොයා ගන්නා ලද ක්‍රමයක් නොවේ. මේ ක්‍රමයේ නමට මුල් වී ඇති ස්ටෙමා යන වචනයේ පරම්පරාව හෝ පවුල් ගස යන අදහස ඇත. එමගින් පවතින සාක්‍ෂ්‍ය අතර සම්බන්ධතාව දැක්වේ. මෙය Cladorama යන වචනයෙන් ද හඳුන්වනු ලැබේ. “වැරදි සමූහය මූලාරම්භයේ වූ සමූහය හඟවයි” යන මූලධර්මය මත මෙය ගොඩ නැඟී ඇත. සාක්‍ෂ්‍ය දෙකක් තුළ පොදු වැරදි රාශියක් තිබේ නම්, තමන්ට සමීප අතීතයේ වූ එක් පොදු මූලාශ්‍රයකින් ඒවා පැවත එන බව ඉන් අදහස් කෙරේ. එය උත්තරපූර්වාදර්ශය (hyperachetype) ලෙස හඳුන්වනු ලැබේ. අතරතුර වූ නැතිව ගිය මූලාශ්‍රයන් අතර සම්බන්ධතාව ද මේ ක්‍රමය මගින් නිශ්චය කෙරේ. ඒ සඳහා ලබා ගත හැකි අත්පිටපත් පවුල් ගසෙහි පිහිටුවා හෝ එක් පූර්වාදර්ශයකින් පැවත එන පවුල් සම්බන්ධතා තුළ පරීක්‍ෂා කෙරේ. ඉන්පසු ඊළඟ පියවර වන තෝරා ගැනීම වෙත එළඹෙයි. එමගින් පූර්වාදර්ශයේ පෙළ ඊට සමීප අතීත පූර්වාදර්ශයන් හා සසඳමින් තෝරා ගැනීම කරනු ලැබේ. නිදසුනක් වශයෙන් කිසියම් රූපයක් පවුල් ගසේ එකම මට්ටමේ නිතර නිතර හමුවේ නම්, ඒ අතරින් වඩාත් ප්‍රමුඛ රූපය තෝරා ගනු ලැබේ. ඉදින් රූප දෙකක් එක සමාන ලෙස දක්නට ලැබේ නම් සංස්කාරක සිය කැමැත්තට අනුව ඉන් එකක් තෝරා ගනී. එසේ තෝරා ගැනීමෙන් පසුව ද කෘතියේ තවත් වැරදි ඉතිරි වී තිබිය හැකිය. ඊට හේතුව නම් ඇතැම් ඡේද සඳහා නිවැරදි රූපය තෝරා ගන්නට ප්‍රමාණවත් තරම් රූප මූලාශ්‍ර කෘතියේ ඉතිරි වී නොතිබීමයි. පරීක්‍ෂණය යන පියවරේ දී සදොස් පද සොයා ගැනීමට උත්සාහ දරනු ලැබේ. ග්‍රන්ථයේ පෙළ දූෂිත යැයි සංස්කාරක තීරණය කළහොත් “සංශෝධනය” යන පියවර ගනු ලැබේ. මේ ක්‍රමයේ එන සිලෙක්ෂන් හෙවත් තෝරාගැනීම යන අවස්ථාව තෝරා ගැනීමේ සංස්කරණ ක්‍රමයටත් පරීක්‍ෂණය හා ශුද්ධිය යන අවස්ථා copy- editing ක්‍රමයටත් සමාන බවක් දක්වයි.

## පදනම් කෘතිය (Copy-Text)

Roanld B Mckerrow විසින් 1904 දී මේ ක්‍රමය හඳුන්වා දෙන ලදි. “මගේ ග්‍රන්ථයට පදනම් වූ කෘතිය” ලෙස ඔහු එය පැහැදිලි කර ඇත. පවුල් ගස ක්‍රමයේ සීමාවන් තේරුම් ගත් ඔහු මේ ක්‍රමය යෝජනා කළේ විශ්වාසය තැබිය හැකි කෘතියක්/පිටපතක් තෝරා ගැනීම වඩා නුවණට හුරු බව තේරුම් ගත් පසුවය. එසේ තෝරා ගත් පිටපතේ පෙළ ඉතාමත් දූෂිත බැව් පෙනෙන විට ඒ තැන් පමණක් ශුද්ධ කළ යුතුය. ජෝසෆ්

බේදියෙ නම් ප්‍රංශ විචාරකයා ද කියා ඇත්තේ සංස්කාරකවරයා, ලබා ගත හැකි හොඳම පිටපත භාවිත කළ යුතු බවයි. එසේ තෝරා ගනු ලබන පිටපත ශෝධනය කළ යුත්තේ ඉතාමත් අඩුවෙනි. මැක්කෙරෝ යෝජනා කළ ක්‍රමය අනුව හොඳම එක ලෙස තෝරා ගනු ලබන පිටපත පිළිබඳව මැක්කෙරෝ තම මතය වරින් වර වෙනස් කර ඇත. කෙසේ වෙතත් හොඳම පැරණි පිටපත තෝරා ගෙන, කතුවරයාගේ යෙදුම් ලෙස පෙනී යන නිවැරදි පාඨ ඇතුළත් කළ යුතුයයි ඔහු පසුව පවසා ඇත.

පන්සිය පනස් ජාතක පොතේ ශාස්ත්‍රීය සංස්කරණය (2004) සඳහා මහාචාර්ය ආනන්ද කුලසූරිය ලියූ දීර්ඝ හැඳින්වීමෙහි ග්‍රන්ථ සංස්කරණය හා සම්බන්ධ ගැටලු හා විවිධ සංස්කාරකවරුන් අත්හදා බලා ඇති ප්‍රශස්ත සංස්කරණ විධීන් පිළිබඳව ද කරුණු රාශියක් ඉදිරිපත් කර ඇත. එසේම යුරෝපීය සම්භාව්‍ය ග්‍රන්ථ හා භාරතීය ග්‍රන්ථ සංස්කරණය කෙරෙහි සැලකිලිමත් වූ වියතුන් විසින් යොදා ගන්නා ලද ක්‍රම හා මූලධර්ම පිළිබඳ පැහැදිලි කිරීමක් ද කරයි. (පන්සිය පනස් ජාතක පොත, ශාස්ත්‍රීය සංස්කරණය 2004) ග්‍රන්ථ සංස්කරණය ශාස්ත්‍රීය කාර්යයක් බවත් එහිදී පැන නගින ගැටලු විසඳා ගන්නා ආකාරයත් කුලසූරිය නිදසුන් මගින් පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත. මේ සඳහා යුරෝපීය වියතුන්ගේ මත පමණක් නොව මහාභාරතයේ ප්‍රශස්ත සංස්කරණයක් කළ වී. එස්. සුක්තන්කර් වැනි ප්‍රවීණයන්ගේ අදහස් ද අවධානයට යොමු කර ඇති බව ඉහත සඳහන් කළෙමු. අප ඉහත සාකච්ඡා කළ අන්දමේ ශාස්ත්‍රීය ග්‍රන්ථ සංස්කරණය මෑත දී අපට යුරෝපයෙන් ලැබුණ දෙයක් ම නොව එය පුරාණ භාරතීය ශාස්ත්‍රීය සම්ප්‍රදායේ අංගයක් වශයෙන් පැවතුණ දෙයක් බව ද මහාචාර්යවරයා මෙහි දී පෙන්වා දී ඇත. යුරෝපීය හා භාරතීය වියතුන්ගේ අදහස් සමාලෝචනය කරන කුලසූරිය අනතුරුව දේශීය අත්පිටපත් සංස්කරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉතා ප්‍රයෝජනවත් සාකච්ඡාවක් ඉදිරිපත් කරයි. සිංහල පුස්කොල පිටපත්වල තත්ත්වය මෙන්ම ඒවා සංස්කරණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු විශේෂ කරුණු ද සිංහල භාෂාවට ආවේණික වූ ඇතැම් මූලික ලක්ෂණ හා ගැටලු ද කුලසූරිය පාඨක අවධානයට යොමු කරවයි. එබැවින් ග්‍රන්ථ සංස්කරණය ශාස්ත්‍රීය විෂයයක් වශයෙන් හදාරන්නවුන් මෙන්ම ග්‍රන්ථ සංස්කරණයෙහි ප්‍රායෝගික වශයෙන් යෙදෙන්නට බලාපොරොත්තු වන විද්වතුන් විසින් ද එම පෙරවදන විශේෂයෙන් ම භාවිත කළ යුත්තක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි. මෙම කෙටි සාකච්ඡාව අවසන් කිරීම සඳහා කුලසූරියගේ පෙරවදනින් කොටසක් උපුටා දැක්වීම සුදුසුයැයි සිතේ.

"සෑම කල්හිම ලියන්නන්ගේ නොසැලකිල්ල ද නො දැනුම ද හේතු කොට ගෙන පොත් මිටිවලද අත් පොත් ගෙඩිවල ද අතින් ලියන ලද පිටපත් මගින් පවත්වා ගෙන එන ලද කුලවත් ග්‍රන්ථවල ඉතිහාසයෙන් පෙනෙන්නේ ඒවා විකලත්වයට පැමිණැවීමෙන් ද විරූප කිරීමෙන් ද ඒවාට මහත් සේ හානි කොට ඇති බව පෙන්නා දෙනු ලැබීමයි. විචාර පූර්වකව විග්‍රහ කිරීමේ පිළිවෙතක් අනුවයෑමෙන් ද ග්‍රන්ථ සංස්කරණයෙහි පිළිගත් පිළිවෙතක් යෙදීමෙන් ද ඒ මුල් ලියනය (අත් ලියනය) සෙවීමේ අටියෙන් කළ තැතින් වියතුනට ඒ පැවති දෘශ්‍ය තත්ත්වය වටහා ගන්නට හැකි වී තිබෙයි. මුල් ලියනය නම් කතුවරයා හෝ කතුවරයන් අතින් ලියැවුණු මුල් පෙළයි."



**ආශ්‍රිත ග්‍රන්ථ හා වැඩිදුර කියැවීම.**


* හෙට්ටිආරච්චි. ඩී.ඊ. ධම්පියා අටුවා ගැටපදය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රකාශන මණ්ඩලය, කොළඹ, 1974
* ලඞ්කානන්ද හිමි, ලබුගම. ඇම්.ඩී. ගුණසේන සහ සමාගමය. කොළඹ. 1968
* ආනන්ද කුලසූරිය, පී.බී. මීගස්කුඹුර, උදය ප්‍රශාන්ත මැද්දේගම, වරකාවේ ධම්මාලෝක හිමි හා පොල්ලමුරේ සෝරත හිමි. (සංස්කාරක වරු) පන්සිය පනස් ජාතක පොත - ශාස්ත්‍රීය සංස්කරණය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය. කොළඹ 2004.
* ඥානාලෝක හිමි, කෝදාගොඩ, අමාවතුර, ඇම්.ඩී. ගුණසේන සහ සමාගමය. කොළඹ, 1967
* සමරනායක, ඩී.පී. ආර්. නිකාය සංග්‍රහය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ, 1966
* Gregg, W.W. (1950) "The Rationale of Copy-Text" Studies in Bibliography 3:19-36
* Mass, Paul. (1968) Textual Criticism. Oxford University Press: ISBN 0-198-14318-4
* Mckerrow, R.B. (1939). Prologomena for the Oxford Shakespeare. Oxford: Clarendon Press.
* Housman, A.E. (1922). "The Application of Thought to Textual Criticism". Proceedings of the Classical Association 18:67-84
* Schiffman, Lawrence H., Reclaiming the Dead Sea Scrolls: the History of Judaism......, Jewish Publication Society, 1st ed.1994, ISBNO-827-60530-7 Website: http://en.wikipedia. org/wiki/Textual-criticism